ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1990 අංක 30 දරන
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 අගෝස්තු මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 අගෝස්තු මස 24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 30 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 අගෝස්තු මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 35/89

## 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 30 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි " මරණය සිදුවීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ ඔහු තම ධූරය කලින් හිස් කළහොත් මිස, ඔහු විසින් තුන් අවුරුදු කාලසීමාවක් තම ධූරය දැරිය යුතු ය." යන වචන වෙනුවට, " මරණය සිදු වීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ ඔහු තම ධූරය කලින් හිස් කළහොත් මිස, ඔහු විසින් තුන් අවුරුදු කාලසීමාවක් තම ධූරය දැරිය යුතු ය: — 1981 අංක 68 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුවද, තුන් අවුරුදු කාලසීමාවක් ධූරය දැරූ සේනා විධායක යකුට එක් අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා ධූරයෙහි නොකඩවා රැඳී සිටීමට ජනාධිපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 7ආ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 7ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" කුලපතිවරයා. 7ආ. (1) ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු කුලපතිවරයකු අභ්‍යාස ආයතනයේ සිටිය යුතු ය. කුලපතිවරයා අභ්‍යාස ආයතනයේ ප්‍රධානයා විය යුතු අතර, ඔහු නම් කරනු ලැබූ දින යේ පටන් අවුරුදු පහක කාලසීමාවක් ඔහු ධූරය දැරිය යුතු ය. තවද, ඔහු පැමිණ සිටින විට අභ්‍යාස ආයතනයේ යම් උපාධි ප්‍රදානෝත්සවයක මුලසුන දැරිය යුතු ය.

(2) මරණය නිසා හෝ ජනාධිපතිවරයා වෙත යවනු ලැබූ ලිපියකින් ඉල්ලා අස්වීම නිසා හෝ ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු

ලැබීම නිසා හෝ යම් කුලපතිවරයකු ධුරය හිස් කරනු ලැබුවහොත්, තම පූර්වගාමියාගේ ධුර කාල යේ ඉකුත් නොවූ කාලසීමාව සඳහා ඒ කුලපති වරයා වෙනුවෙන් අනුප්‍රාප්තවීමට නම් කරනු ලබන තැනැත්තා ධුරය දැරිය යුතු ය.

(3) අභ්‍යාස ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවය සඳහා වූ කාර්ය පරිපාටිය නියම කරනු ලැබ ඇති පරිදි විය යුතු ය.".

යම් අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.